**වත්තල ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

වත්තල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු තැන්පත් ලේඛනයේ තැන්පතු වර්ග දෙකක තැන්පතු 35 ක වටිනාකම රු.1,621,492 ක් අවසන් ගිණුමෙන් මගහැරී තිබුණි. | පිළිගනිමි. අවසන් ගිණුම මුද්‍රණය කිරීමේදී මෙම අතපසු වීම සිදු වී තිබූ අතර පසුව එය නිවැරදි කර ඇත. | සියළුම පොදු තැන්පතු වටිනාකම් අවසන් ගිණුම් වල දැක්වීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට එක් තැන්පතුවක වටිනාකම රු.41,936 ක් අවසන් ගිණුමට රු.419,363 ක් ලෙස ගෙන තිබූ බැවින්, තැන්පතු රු.377,427 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ලේඛනයට ඇතුළත් කිරීමේදී අතපසු වීමකින් ඉලක්කමක් වැඩිපුර සටහන් වී ඇත.පසුව එය නිවැරදි කර ඇත. | වටිනාකම් නිවැරදිව අවසන් ගිණුම් වලට ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | තැන්පතු ලේඛනයේ නොමැති තැන්පතු වර්ග දෙකක තැන්පතු 15 ක රු.414,463 ක් වූ වටිනාකමක් අවසන් ගිණුමට ගෙන තිබුණි. | පිළිගනිමි.තැන්පත් විෂය භාර නවක නිලධාරිනිය විසින් ලේඛණ යාවත්කාලීන කිරීමේදී සිදු වූ අතපසු වීමකි.පසුව එය නිවැරදි කර ඇත. | සියළුම තැන්පතු තැන්පතු ලේඛනයක් සකස්කර අවසන් ගිණුමට ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට නිදහස්කර තිබූ කොන්ත්‍රාත් අත රැඳවුම් 05 ක වටිනාකම රු.505,204 ක් අවසන් ගිණුමට ගෙන තිබුණි. | පිළිගනිමි. තැන්පත් විෂය භාර නවක නිලධාරිනිය විසින් ලේඛණ යාවත්කාලීන කිරීමේදී සිදු වූ අතපසු වීමකි.පසුව එය නිවැරදි කර ඇත. | තැන්පතු ශේෂ නිවැරදිව ගිණුම්වලට ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඉ) | කම්පැක්ටර් රථ දෙකෙහි ණය වාරික රු.10,080,000 ක් අයකරගතහැකි උපයෝගී සේවා ගිණුමට ගලපා නොතිබීමෙන් එම වටිනාකමින් අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. 2021 වර්ෂයේ ජර්නල් සටහනක් යොදා නිවැරදි කර ඇත. | සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් රු.78,408,018 ක් පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 2017 හි අංක 9.9 ට අනුව අයභාරය හඳුනාගැනීමේ නිර්නායකය අනුව ගලපා නොතිබුණි. | පිළිගනිමි.2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 2017 හි අංක 9.9 අනුව සැකසීමට කටයුතු කරමි. | ප්‍රමිතය පරිදි විස්තීරණ ආදායමෙන් අඩු කිරීමට කටයුතු කළයුතු වේ. |
| (උ) | 2019 වර්ෂයේ ලැබියයුතු ස්ථාවර තැන්පත් පොළී රු.718,356 ක් වැරදීමකින් තැන්පත් ගිණුමට බැරකිරීමේ වරද නිවැරදි කිරීමේදී තැන්පත් ගිණුම හර කිරීම වෙනුවට සංචිත හා වෙන් කිරීමේ ගිණුමට හර කර තිබුණි. | පිළිගනිමි.2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගැලපියයුතු වේ. |
| (ඌ ) | සංචිත හා වෙන් කිරීමේ ගිණුමේ රු.45,504,767 ක් වූ ශේෂය වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ස්කන්ධය යටතේ දක්වා නොතිබුණි. | පිළිගනිමි.2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ස්කන්ධය යටතේ දැක්වීමට කටයුතු කළයුතු වේ. |
| (එ ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොතිබූ අතර ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ශේෂය රු.248,415,167 ක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ඉඩම් හා ගොඩනැගිලි ලෙස සංචිත හා වෙන් කිරීමේ ගිණුමට රු.200,000 ක් අඩුවෙන් ගලපා තිබුණි. උපලේඛන තුළද අඩුවෙන් සටහන්කර තිබුණි. | පිළිගනිමි. ඉඩම් හා ගොඩනැගිලි 2021 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන අතර උපලේඛණයේ හා ගිණුමේ මඟහැරී තිබූ රුපියල් ලක්ෂ දෙකක (රු.200,000.00) වටිනාකමේ දෝෂය තහවුරු කරගෙන ජර්නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් ප්‍රත්‍යාගණනයකර ගිණුම්වල නිවැරදිව ගැලපියයුතු වේ. |
| (ඒ) | ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.389,015,608 ක් හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.45,391,670 ක් සංචිත හා වෙන් කිරීමේ ගිණුමට නොගලපා සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | පිළිගනිමි.2021 වර්ෂයේ ජර්නල් සටහනක් මඟින් නිවැරදි කර ඇත. | හඳුනා නොගත් තැන්පතු හඳුනා ගැනීමට කටයුතු කළයුතු වේ. |

### 1.6.2. නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 4 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අදාළ **අනුරූපී වාර්තා අනුව වටිනාකම** අතර රු.1,376,998 ක වෙනසක් විය. | මෙම වෙනස පිළිබඳව සොයා බලා නිවැරදි කර ගනිමි. පිළිගනිමි. 2021 වර්ෂයේ ජර්නල් සටහනක් මඟින් නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන අතර ශේෂයන් සැසඳුම්කර ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වේ. |

### 1.6.3. විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.751,883 ක් වූ ශේෂයන් 2 ක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | පිළිගනිමි. මෙම ගිණුම් සඳහා ලේඛණ ගත සාක්ෂි සොයා ගැනීමට නොහැකි වී ඇත. තවදුරටත් ඒ පිළිබඳව අවධානය යොමු කරමි. | සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1. නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 219 වගන්තිය | ප්‍රාදේශීය සභාවක කිසිම සභිකයෙකු හෝ සේවකයෙකුට ප්‍රාදේශීය සභාව සමග ඇතිකරන ලද යම් ගිවිසුමක හෝ වැඩයක මූල්‍ය සම්බන්ධතාවයක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබියයුතු වුවද, සභාවේ | පිළිගනිමි. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

| | | |
|---|---|---|
| | මන්ත්‍රීවරයෙකුගේ බිරිඳට උත්සව ශාලාව බදුදී තිබූ අතර එයින් 2009 මැයි 30 දින සිට අයවියයුතු රු.974,800 ක හිඟ බදු කුලී ශේෂයක් තිබුණි. | |

1.8 **ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අප්‍රේල් 26 දිනැති හා අංක LGD/04/2016 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයට පටහැනිව, දිස්ත්‍රික් සහකාර කොමසාරිස්ගේ අනුමැතියෙන් තොරව 2018 වර්ෂයේ රුපියල් මිලියන 80 ක්, 2020 වර්ෂයේ රුපියල් මිලියන 60 ක් හා 2021 වර්ෂයේ රුපියල් මිලියන 20 ක් වශයෙන් ස්ථාවර තැන්පත් මුදල් කරගෙන තිබුණ අතර, ස්ථාවර තැන්පත් මුදල් කරගැනීමේ මූලික අරමුණ වූ වෙළඳ සංකීර්ණය හා ආදාහනාගාරයට වැය නොකර සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා වැයකර තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී 2016.04.26 දිනැති අංක LGD/04/2016 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කරමි. | අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.257,160,854 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,483,963 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1. වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වරිපනම් හා බදු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අදාළ අනුරූපී වාර්තා අනුව වටිනාකම අතර රු.4,337,332 ක වෙනසක් තිබුණි. හිඟ හිටි කාලය වසර 3 ත් 5 ත් අතර රු.18,930,318 ක්, වසර 5 ත් 10 ත් අතර රු.19,040, 989 ක් හා වසර 10 ට වැඩි රු.14,546,536 ක් ලෙස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ හිඟ වරිපනම් ශේෂය තුල, වසර 05 ට වැඩි කාලයක සිට පැවත එන වැලිසර, පමුණුගම හා හැඳල උප කාර්යාල වල පිළිවෙලින් වරිපනම් ඒකක 1587 කින් රු.6,279,966 ක්, ඒකක 986 කින් රු.1,966,759 ක් හා ඒකක 4144 කින් රු.18,275,500 ක් වශයෙන් හිඟ වරිපනම් පැවතුනද, දේපල තහනම් කිරීම් කිසිවක් සිදුකර නොතිබුණි.<br>තවද, වරිපනම් ආදායම වැඩිකරගැනීම සඳහා නව වරිපනම් ඒකක හඳුනාගැනීම පිණිස විධිමත් වැඩ පිළිවෙලක් ගෙන තිබූ බවට සාක්ෂි ඉදිරිපත් නොවුන අතර අවසන් වරට සභා බල ප්‍රදේශයේ නිශ්චල දේපල තක්සේරුවක් සිදුකර වර්ෂ 10 ක් ඉක්මගොස් තිබීම නිසා දේපල 58,003 කින් වර්තමාන තක්සේරු වටිනාකම් මත වරිපනම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත, කපා ඉවත් කළ සියළුම රජයේ ඉඩම්වල පදිංචිකරුවන්ගේ වරිපනම් බදු ප්‍රමාණය පරිගණක මෘදුකාංගයෙන් පමණක් සම්පූර්ණයෙන්ම ඉවත් කර නොමැත්තේ 2016 වර්ෂයේ හිඟ වරිපනම් එකතු කිරීම සම්බන්ධයෙන් පවතින විමර්ශනය හේතුවෙනි. එම විමර්ශනයේ අවසන් තීරණයෙන් පසුව මෙම වෙනස නිවැරදි කර ගැනීම සඳහා කටයුතු කරමි.<br>නව වරිපනම් බදු තක්සේරුවක් සඳහා අදාළ ලේඛන තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇත. 2020 වර්ෂයේදීම තක්සේරුව සඳහා අවශ්‍ය තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුවට ලබා දීමට නියමිතව වුවත් දිවයින තුළ පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් තාවකාලිකව නැවතී ඇත.. නව වරිපනම් බදු තක්සේරුවක් සඳහා අදාළ ලේඛන තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇත. ඉදිරියේදී දේපල තහනම් කිරීම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමි. | හිඟ වරිපනම් අයකර ගැනීමට ද, වරිපනම් ඒකක හඳුනා ගැනීමට ද , දේපල තහනමට ගෙන හිඟ වරිපනම් අයකර ගැනීමටද, මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන අතර ශේෂයන් සැසඳුම්කර ගිණුම් පවත්වාගෙන යාමටද කටයුතු කළයුතු වේ. |

**2.2.2. දිගුකාලීන බදු දේපල**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දීර්ඝකාලීනව බදු දෙන දේපල වලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ කඩ කුලී ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද බදු දේපල 166 ක් සභාව සතුව පැවති නමුත්, 2016 දෙසැම්බර් 14 දින දේපල 49 ක් සඳහා පමණක් තක්සේරු සිදුකර තිබුණි. එම කඩ කාමර 49 සඳහාද 2020 වර්ෂයේ නව තක්සේරුවක් සිදුකර නොතිබූ අතර ඉතිරි දේපල 117 කට අදාලව සිදුකරන ලද තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2020.12.31 දිනට පැවති හිඟයෙන් 2021.04.30 දින වනවිට රු.1,108,460.89 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත.<br>දේපල තිස් එකක් (31) සඳහා 2020 වසරේදී තක්සේරු වාර්තා ලබා ගෙන ක්‍රියාත්මක කර තිබෙන අතර හැත්ත හතරක් (74) සඳහා නව වෙළෙඳ සංකීර්ණයක් ඉදිකරමින් පවතින බැවින් අවසන් වූ වහාම නව තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කරමි. නොපමාව සභාව සතු ඉතිරි දේපල සියල්ල තක්සේරු කිරීමට කටයුතු කරමි.<br>හැඳල වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ 2007 වසරේ සිට 2017 වසර දක්වා පවතින හිඟ මුදලවන රු.5,297,637 අය කර ගැනීමට නොහැකි මුදලක් සේ සලකා කපා හැරීමට අනුමැතිය සඳහා පලාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇත.<br><br>කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වෙළඳසැල් වසා තැබීම නිසා බදුකරුවන්ට සහන සැලසීම සඳහා රු.702,439 ක මුදලක් කපා හැරීම සඳහා පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇත. | නව තක්සේරුවක් සිදුකිරීමටද, හිඟ කුලී අයකර ගැනීමටද කටයුතු කළයුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල දෛනිකව දිරන කසළ ටොන් 16 ක් හා නොදිරන කසළ ටොන් 07 ක් වශයෙන් එකතු කරන නමුත් 2008 ජූලි 30 දිනැති අංක 1560/06, 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන හා 2011 ජූලි 05 දිනැති අංක 1713/11 දරන ගැසට්පත්‍ර ප්‍රකාරව කසළ බදු හෝ ගාස්තු පනවා නොතිබුණි. මෙම නිසා සභාවට කසළ බදු ලෙස ලබාගතහැකිව තිබූ සැලකියයුතු ආදායමක් අහිමිව තිබුණි. | ඉදිරියේදී කසල වෙනුවෙන් ගාස්තුවක් අය කිරීම සඳහා පුද්ගලික ආයතන විස්සකට(20) වැඩි සංඛ්‍යාවක් සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර ආරම්භයක් වශයෙන් 2021/06/01 දින සිට කෙරවලපිටිය පැරඩයිස් ආයතනයෙන් මාසික ගාස්තු අය කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

(ආ) **මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ අනවසර ඉදිකිරීම් ,ගස් කැපීම් වැනි මහජන පැමිණිලි 234 කින් 35 ක් විසඳා තිබූ අතර පැමිණිලි 199 ක් විසඳීමට පියවර ගෙන නොතිබුණි | මහජන පැමිණිලි සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර තිබුණත්, බොහෝමයක් පැමිණිලි සඳහා අවසාන විසඳුමක් ලබා දීමට අපොහොසත් වී ඇත්තේ අප ආයතනයට අමතරව වෙනත් ආයතනවලින් අවශ්‍ය කරන මැදිහත් වීම ප්‍රමාද වීම හේතුවෙනි. | මහජන පැමිණිලි විසඳීමට පියවර ගතයුතු වේ. |

3.2. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු දික්ඕවිට අක්කර 02 පර්චස් 24 ක බිම් ප්‍රමාණයක් ජීව වායු නිපදවීමට 2006 සැප්තැම්බර් 01 දින පුද්ගලික ආයතනයකට වසර 10 ක කාලයකට බදු දී තිබුණි. නමුත් රු.525,000 ක හිඟ මුදලක් තිබියදී එය අයකර නොගෙන 2011 අප්‍රේල් 25 දින ගිවිසුම අවලංගුකර 2011 ජූලි 05 දින සිට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට රු.25,000 ක මාසික | මේ සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය තොරතුරු තවදුරටත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් ලබා ගෙන ඉදිරියේදී ඉදිරිපත් කරමි. | හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කළයුතු වේ. |

කුලියට බදු දී තිබුණි මේ දක්වා හිඟය රු.2,925,000 ක් වූ අතර පෙර හිඟ මුදල්ද සමග මුළු හිඟය රු.3,450,000 ක් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

## 3.3. වත්කම් කළමනාකරණය

-----------------------------

### 3.3.1. ආදායම් උපයාගත හැකිව තිබූ වත්කම් වලින් ආදායම් උපයා නොගැනීම

-----------------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ------------ |
| (අ) | පුද්ගලික රථ ගාල<br>---------------------- | | |
| | රූඩ් 02 පර්චස් 11 ක විශාලත්වයෙන් යුක්ත හැඳල සෝසාතක ස්ථානය පිහිටි ඉඩමේ 2014 වර්ෂයේ රු.මිලියන 02 ක් වැය කරමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර එම ස්ථානය වර්තමානයේ පුද්ගලික බස් හා රථවාහන ගාලක් ලෙස භාවිතා කරන නමුත් එම පරිශ්‍රයෙන් ආදායමක් උපයාගැනීමට ක්‍රියාකර නොතිබුණි. මෙම පරිශ්‍රය සම්බන්ධයෙන් 2021 මාර්තු 04 දින තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදුකළ තක්සේරුව අනුව මාසික බද්ද රු.81,333 ක් විය. ඒ අනුව 2014 වර්ෂයේ සිට සභාවට රැස්කරගත හැකිව තිබූ සැලකියයුතු ආදායමක් නිලධාරීන්ගේ නොසැලකිල්ල මත සභාවට අහිමිව ගොස් තිබුණි. | පිළිගනිමි. 2021 මාර්තු 04 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති තක්සේරුව ප්‍රකාරව ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත බදු දීම සඳහා ඉදිරිකටයුතු සිදු කරමින් පවතී. | බද්දට හෝ කුලියට දීමෙන් ආදායම් උපයාගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | ප්‍රීතිපුර වෙරළ ආකර්ෂණ වෙරළක් බවට පත් කිරීම.<br>---------------------------------------------------- | | |
| | බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේ ප්‍රීතිපුර වෙරළ පරිශ්‍රයේ වෙළඳ කුටි කිහිපයක්, වැසිකිළි පද්ධතියක්, කණුවක් මත ජල ටැංකියක් හා පරිශ්‍රයේ විදුලි පහන් කණු සකස්කර පරිශ්‍රය අලංකාර කර සංචාරක ආකර්ෂණයෙන් යුත් ප්‍රදේශයක් බවට පත්කර තිබුණද ,එම පරිශ්‍රයෙන් 2013 වර්ෂයේ රු.46,780 ක් හා 2014 ජූලි මාසය දක්වා රු.4,300 ක ආදායමක්ද රැස්කරගෙන තිබූ නමුත් නාන ස්ථානයේ ජල ටැංකිය කඩා වැටී ජල සැපයුම ඇණහිටීම නිසා 2014 ජූලි මාසයෙන් පසුව ආදායම අහිමිව ගොස් තිබූ අතර එම | පිළිගනිමි. බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර සුදුසු පියවරක් ගැනීම සඳහා කටයුතු කරමි. | වත්කම් වලිවලින් ආදායම් උපයාගැනීමට කටයුතු කළයුතු වේ. |

ස්ථානය පිළිසකර කර නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.3.2. වත්කම් අන්සතු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 වර්ෂයේදී ආචාර්ය නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණෝ විසින් රු.188,000 ක වටිනාකමක් මත තෑගි ඔප්පුවකින් වත්තල ප්‍රාදේශීය සභාවට පිරිනමන ලද අක්කර 11 රූඩ් 02 පර්චස් 11 ක් විශාල උස්වැටකෙයියාව පාර්ස් වත්ත ඉඩම, සභාපති හා ලේකම් විසින් 1991 වර්ෂයේදී ඉඩම් කොටස් 57 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවකට බෙදා තෑගි ඔප්පු මගින් අන්සතු කර තිබුණි. | මේ සඳහා ප්‍රමාණවත් තොරතුරු සභාව සතුව නොමැති බැවින් තවදුරටත් සොයා බැලීමට කටයුතු කරමි. | සභාවට පවරාගැනීමට කටයුතු කළයුතු වේ. |